**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2023**

---

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2023 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2022 හා 2023 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2024 නොවැම්බර් 29 වනවිටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාව සඳහා 2024 මැයි මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබුණු නමුත් පසුව ගිණුම් ලේඛන පරීක්ෂා කිරීමේදී හඳුනා ගන්නා ලද අඩුපාඩු සකස් කළ යුතුව පවතින බව අධ්‍යක්ෂ (මුදල් හා පාලන) විසින් දැනුම් දී තිබුණි. එහෙත්, අධ්‍යක්ෂ (මුදල් හා පාලන) 2024 ඔක්තෝබර් මස 6 වෙනි දින සිට තනතුරෙන් ඉල්ලා වීම නිසා නව වැඩපිළිවෙළක් සකස් කර කඩිනමින් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2018අංක 19දරන ජාතික විගණන පනතෙහි (1)16උප වගන්තිය | මණ්ඩලයේ ගනුදෙනු සම්බන්ධයෙන් වන ලෙජර සටහන් අඛණ්ඩව, කාලීනව ලෙජර ගිණුම්වල සටහන් කර නොතිබුණු අතර 2024 අගෝස්තු 30 දින වනවිටත් 2023 වර්ෂයේ ගනුදෙනු පරිගණක මෘදුකාංගයට ඇතුළත් කරමින් පැවතුණි. 2024 ජනවාරි මාසයේ සිට සිදුවුණු ගනුදෙනු මුදල් | 2024 වර්ෂයේ සිදුවුණු ගණුදෙනු, ගිණුම්කරණ මෘදුකාංගය මගින් ගිණුම්ගත කිරීම සඳහා ගිණුම් අංශයේ නිලධාරීන්ට නිසි උපදෙස් ලබා දී නොමැති බව අනාවරණය විය. එමෙන්ම, අධ්‍යක්ෂ (මුදල් හා පාලන) 2024 ඔක්තෝබර් මස 6 වෙනි දින ස්වකැමැත්තෙන් ඉල්ලා අස් වී තිබේ. ඒ අනුව | සියළු ගණුදෙණු අඛණ්ඩව හා යාවත්කාලී නව ලෙජර ගිණුම්වල සටහන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පොතේ සටහන් කිරීම හැර අනෙකුත් ලෙජර් ගිණුම්වලට සටහන් කිරීම් හා ජ'නල් සටහන් මඟින් ගිණුම්ගත කළ යුතු ගනුදෙනු කාලීනව ගිණුම්ගත කිරීම සිදුකර නොතිබුණි. | ගිණුම්ගත කිරීම ප්‍රමාද වී ඇති 2024 වර්ෂයේ ගණුදෙනු ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියට ඇතුළත් කිරීම සඳහා නව වැඩපිළිවෙලක් සකස් කර ගිණුම්කරණය පද්ධතිය යාවත්කාලින කර ගැනීමට කටයුතු කරන බව. | |
| (ආ) | 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත | | | |
| (i) | 12(2) (අ) හා (ආ) වගන්ති | පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයට ඇතුළත් අයිතම 2015 වර්ෂයේදී නව පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතියකට ඇතුළත් කිරීමේදී අයිතම 330,228 ක් ඇතුළත් වී නොතිබුණු අතර ඇතුළත් වූ අයිතම්වලද සමහර දත්ත සාවද්‍ය වුයෙන් පාඨකයින්ට මෙම සම්පත් පරිශීලනය කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි. ඉන් කිසිදු පරිග්‍රහණ ලේඛනයකට ඇතුළත් නොවුණු පොත් නව පුස්තකාල කළමනාකරණ පද්ධතියට (KOHA) ඇතුළත් කිරීමේ ප්‍රගතිය ද සතුටුදායක මට්ටමක නොපැවතුණි. | කොහා දත්ත පදනමට ඇතුළත් නොවූ 496,468ක පැරණි ප්‍රකාශන දත්ත පදනමට ඇතුළත් කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් අනුව එම වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පියවර ගෙන තිබේ. ජාතික පුස්තකාල එකතුව විධිමත්ව ක්‍රමවත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කරගෙන යමින් පවතින බව. | පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතිය යාවත්කාලීනව නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 12(2) (උ) වගන්තිය | ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශයට පත් කළ යුතු කාලවකවානු නියම කර නොතිබුණු අතර 2024 නොවැම්බර් 5 දින වන විට 2024 මාර්තු කලාපය දක්වා ප්‍රකාශන කටයුතු අවසන් කර 2023 දෙසැම්බර් මාසය දක්වා පමණක් ග්‍රන්ථ නාමාවලි මුද්‍රණය කිරීම් කර තිබුණි. | ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ මාසික කලාප සඳහා විවිධ මූලාශ්‍ර මගින් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ලබා ගන්නා අතර, එම තොරතුරු පරිගණකගත කිරීම, වර්ග අංක යෙදීම, විෂය ශීර්ෂ යෙදීම, සෝදුපත් පරීක්ෂා කිරීම, අවසන් පිටපත සකස් කිරීම, මුද්‍රණය හා ප්‍රකාශයට පත් කිරීම සඳහා යන කාලය අනුව යම් ප්‍රමාදයක් සිදු වන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756, 757 | ජාතික පුස්තකාලයේ සංරක්ෂිත ප්‍රලේඛන සම්පත් සමාලෝචිත වර්ෂය තුළදී සමීක්ෂණය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ජාතික පුස්තකාල සංරක්ෂිත පොත් තොගය අදියර වශයෙන් සමීක්ෂණය කිරීම සඳහා 2023 වර්ෂයේ සිට අභ්‍යන්තර සැලැස්මකට අනුව කටයුතු කර ඇති අතර, එහි පළමු අදියර යටතේ KOHA දත්ත පදනම ආරම්භයේ ඇතුළත් කරන ලද දත්ත පදනම් කර ගනිමින් තොග සමීක්ෂණය පැවැත්වීමට කටයුතු කර ඇති බව. එමෙන්ම, එහි දෙවන අදියරේ සමීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, එහි අවසන් වාර්තාවන් ඉදිරියේ දී ලැබීමට නියමිත බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයෙන් තොරව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ කැනේඩියානු පොදු රාජ්‍ය ඉගෙනුම් සංගමය මඟින් සපයන ලද විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර රු. මිලියන 30ක් මණ්ඩලය වෙත සෘජුවම ලබාගෙන තිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ගිණුම් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම සඳහා අදාළ ව්‍යාපෘති වාර්තාව සමඟ ලිපියක් 2023.02.14 දින යොමු කර ඇත. එසේ ම ඊට අදාළ ව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සමඟ 2024.01.12 වන දින මුදල් අමාත්‍යංශයේ පැවැත්වුණු සාකච්ඡාවට අනුව ද කටයුතු කර නැවත ලිපියක් 2024.07.24 වන දින අධ්‍යාපන අමාත්‍යංශය වෙත යොමු කරන ලද බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1978දෙසැම්බර් 19දිනැති අංක 842දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.383,231,029 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ඇති බව. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික පුස්තකාල ප්‍රලේඛන සම්පත් සංචිතයේ අර්ද්‍රතාවය මනාව පවත්වා ගැනීම සඳහා එහි ස්ථාපිත වායුසමීකරණ පද්ධතිය පැය 24 පුරාම අඛණ්ඩව පවත්වා ගත යුතු වුවත්, විදුලි ගාස්තු ඉහලයාම හේතුවෙන් සතියේ දිනවලදි පැය 17 ක්ද සති අන්ත හා නිවාඩු දිනවලදී පැය 24 ක්ද වායුසමීකරණ පද්ධතිය ක්‍රියාවිරහිත කර තිබුණි. එම තත්ත්වය සංරක්ෂණ කාර්යය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කරන බැවින් විකල්ප බලශක්ති ප්‍රභවයන් මඟින් හෝ විදුලිබල අවශ්‍යතාවය සපුරාගැනීමට මණ්ඩලය අවධානය යොමුකර නොතිබුණි. | මණ්ඩලයේ විදුලි පරිපථ පද්ධතිය විධිමත් ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් සහ විදුලි බිල අවම කර ගැනීම සඳහා දැනට කාර්යාල වේලාව අවසන් වීමෙන් පසු වායු සමීකරණ පද්ධතිය ක්‍රියාත්මක නොකරන බව හා විදුලි බිල අවම කර ගැනීම සඳහා සූර්ය පැනල (Solar Power) මණ්ඩලය තුළ සවි කිරීම සඳහා අවශ්‍ය වාර්තාවක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙතින් ලබාගෙන ව්‍යාපෘති වාර්තාවක් ද සමඟ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති බව. | ජාතික පුස්තකාල ප්‍රලේඛන සම්පත් සංචිතයේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ප්‍රධාන ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කර්මාන්තය බදු රහිත රු.211,937,795 ක වටිනාකමට මාස 09 ක කාලයකින් නිම කිරීම සඳහා 2018 ජනවාරි 24 දින කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. පසුව අවස්ථා 03 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර එකතුව රු.252,463,612 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබියදී, 2021 මාර්තු මාසයේදී කොන්ත්‍රාත්තුව අතරමඟ නවතා දමා තිබුණි. | **ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතුවල ඉතිරි වැඩ (සිවිල්) නිම කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් බස්නාහිර පළාත් ඉංජිනේරු අංශය වෙත පවරා තිබෙන අතර, ඒ සඳහා 2024 වසරට අවශ්‍ය ප්‍රතිපාදන ද මුදා හැරීමට පියවර ගෙන තිබේ. ඉදිරි දින කිහිපය තුළ ටෙන්ඩර් කැඳවීමට නියමිත බව ද දන්වා සිටිමි.** | **ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නවීකරණ කටයුතු කඩිනමින් අවසන්කර ගත යුතුය.** |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රසායනාගාරයේ සංරක්ෂණ කටයුතු සඳහා රු.3,111,195 ක් වැයකර මිලදීගෙන තිබුණු සිදුරු පිරවීමේ යන්ත්‍රය හා උෂ්ණත්වය හා ආද්‍රතාවය පාලන උපකරණය | සිදුරු පිරවීමේ යන්ත්‍රය මේ වන විට අලුත්වැඩියා කර ඇති නමුත් යන්ත්‍රයට අවශ්‍ය කඩදාසි pulp හා ඒවා සකස් කර ගැනීමට මිශ්‍රණ යන්ත්‍රයක් මිල දී ගත යුතු ව ඇත. | ප්‍රලේඛන සම්පත් සංචිතයේ සංරක්ෂණ කාර්යය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2018 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි. | උෂ්ණත්වය හා ආර්ද්‍රතා පාලන යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින බව | |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දින රු.2,992,265 ක් වැය කර මිලදී ගෙන තිබූ RFID Barcode Reader යන්ත්‍රය වාර්ෂිකව සේවා කිරීම සඳහා රු.316,691ක් වැය කර තිබුණ ද, 2024 අගෝස්තු 30 දින වන විටත් පිවිසුම් හා පිටවීමේ දොරටු සඳහා විද්‍යුත් ගේට්ටු ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීමට නොහැකි වී තිබුණි. | 2023 වසර සඳහා RFID ආරක්ෂිත ගේට්ටු මිල දී ගැනීමට අදාළ පිරිවිතර සකස් කළ ද ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන නොලැබුණු බැවින් එම කාර්යය සිදු කළ නොහැකි විය. 2024 වසරේ ද ඒ සඳහා මුදල් වෙන් නොවුණි බැවින් 2025 අයවැය වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන කටයුතු වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස සිදු කිරීමට කටයුතු කළ යුතුය. |